# මහජනතාව වෙත කරනු ලබන දැනුම් දීමයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# පිරමීඩාකාර ව්‍යාපාරවල නිරත වීම දඬුවම් ලැබිය හැකි වරදකි!

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබුණු පැමිණිලිවලට අනුව පහත සඳහන් ආයතන/යෙදවුම් විසින් 1988 අංක 30 දරන බැංකු පනතේ 83(ඇ) වගන්තිය උල්ලංඝනය කරමින් තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්නේද යන්න සොයා බැලීම සඳහා විමර්ශනයන් ඉහත බැංකු පනතට අනුකූලව සිදු කරන ලදී. මෙම විමර්ශන වාර්තාවලට අනුව, පහත ලැයිස්තුගත ආයතන/යෙදවුම් බැංකු පනතේ 83(ඇ) වගන්තියට පටහැනි ලෙස ක්‍රියා කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලදී.

තවද, මෙසේ නම් කරන ලද පිරමීඩාකාර ආයතන වලට විරුද්ධව, බැංකු පනතේ 83(ඇ) වගන්තිය යටතේ අපරාධමය නඩු කටයුතු පැවරීමට සලකා බලනු පිණිස ගරු නීතිපතිවරයා වෙත ඉල්ලීම් යොමු කර ඇති බව ද දන්වා සිටිමු.

**මෙම ලැයිස්තුව, 24.08.2023 වන දින පුවත්පත් මඟින් පලකල ආයතන/යෙදවුම්වල ලැයිස්තුවට අතිරේක ලැයිස්තුවකි.**

1. Beecoin App/Sunbird Foundation
2. Fast Win (Pvt) Ltd
3. Fruugo Oline App/ Fruugo Oline (Pvt) Ltd
4. Genesis Business School/ Era Miracle (Pvt) Ltd
5. Isimaga International (Pvt) Ltd
6. Ledger Block
7. Qnet/Questnet
8. Ride to Three Freedom (Pvt) Ltd

යම් තැනැත්තෙකු 1988 අංක 30 දරන බැංකු පනතේ 83(ඇ) වගන්තියේ විධි විධාන කඩ කරන ආකාරයේ යෝජනා ක්‍රම කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ආරම්භ කිරීම, අර්පණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචලිත කිරීම, පැවැත්වීම, එවැනි යෝජනා ක්‍රම සඳහා මුදල් සැපයීම, හෝ එවැනි යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම හෝ විධාන කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

එවැනි වරදක් සඳහා වන දඬුවම් ලෙස, වසර තුනකට නොවැඩි සිරදඬුවමක් හෝ රුපියල් මිලියනයකට නොවැඩි දඩයක් හෝ සිරදඬුවම් සහ දඩ යන දෙකම හෝ ඇතුළත් විය හැකිය. වරද සිදු කරන ලද්දේ සිතාමතාම හෝ දැන දැනම නැතහොත් එම ක්‍රියාව මගින් වෙනත් යම් තැනැත්තෙකුට අලාභයක් හෝ හානියක් සිදුවන බව දැන දැනම වන අවස්ථාවක එම පුද්ගලයා අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන දෙකක් හෝ එම යෝජනා ක්‍රමයේ සහභාගීකරුවන්ගෙන් ලබාගත් බවට හෙලි වුන හෝ හෙලි කරන ලද එකතු මුදලේ දෙගුණයක වටිනාකමින්යුත් ශ්‍රී ලංකා මුදල් ප්‍රමාණයක් යන දෙකෙන් වඩා වැඩි මුදලට සමාන දඩයකටද යටත් විය හැකිය.

ඒ අනුව, නීතියෙන් දඬුවම් ලැබිය හැකි මෙවැනි ආකාරයේ ක්‍රියාකාරම්වලින් වැලකී සිටින ලෙස මහජනතාව දැනුවත් කර සිටිමු.

**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**

☎ (Hotline) 1935 / +94 11 247 7966